# ස.ණ.ස. පුවත් කොළඹින්

COOP

2019 - ජූලි - හත්වන කලාපය

දායකත්වය රු 15/-











## වසර 5ක කාලයකට පත් වූ

# මහජන නියෝජිතයකු නැවත පත් නොකරමු?

ජාතික සන්ධානයේ නායක සමුපකාර ප්‍රසාදිනී ඩැනිසන් වීරසූරිය

ඡන්දයෙන් පත් කරගන්නා සියලුම මන්ත්‍රීවරුන්ට ඡන්ද දායකයාගේ කැමැත්තට අනුව මැරෙනතෙක්ම වුවද අඛණ්ඩවම පත්වීමේ හැකියාව ඇත්තේ පත්කිරීමේ අයිතිය ඡන්ද දායකයාගේ හිමිකමක් බැවිනි. එහෙත් සමුපකාර සමිතියකට ඡන්ද දායකයාගේ කැමැත්ත මත පත්කළ හැක්කේ අවුරුදු 6 ක කාලයකට පමණක්වන බවට දකුණු පළාත් සභාව කඩිමුඩියේම නීති පනවා ඇත. ඡන්දයෙන් පත්වූවන්ම කර ඇත්තේ ඡන්ද හිමියාගේ අයිතිය පළාත් සභාව යටපත් කිරීමය. මේ කාරණය බරපතළ කරුණක් සේ සමස්ත සමුපකාරික ප්‍රජාවම සැලකිල්ලට ගෙන මහජන මතයක් රට තුළම ගොඩනැගිය යුතුය. සමුපකාරයක කාරක සභාවක ධුර දැරිය හැක්කේ වසර 6 ක් පමණක් නම් මන්ත්‍රී කමක වසර 5 ක කාලයක් එනම් එක්වරක් පත්ව ඊළග අවස්ථාව නවකයෙකුට දීමට කටයුතු කිරීම සාධාරණ නොවන්නේ ද? මේවා සම්මත කළ අය පමණක් නොව එක්වරක් එනම් වසර පහක කාලයකට පත්වූ පළාත් සභාවක හා එක්වරක් පාර්ලිමේන්තුවේ සිටි කෙනෙක් නැවත පත් නොකළ යුතු බවට මහජන මතයක් ගොඩ නැගිය යුතුවේ. නොඑසේනම් ඔවුන් පත් කිරීමට ඡන්දදායකයාට දී ඇති අයිතිය තවදුරටත් තිබිය යුතුවේ. මසකට වරක් පවත්වන සෑම මහා සභාවක දීම මේ කාරණය පෙන්වා දෙමින් ජනතාව අවදියෙන් තබා ගැනීමේ වැදගත් කම අවධාරණය කරවමි.

මෙම නීතිය පනවා ඇත්තේ පළාත් සබාව විසුරුවා හැරීමට ආසන්නවම පසුගිය මාර්තු 26 දාය. ප්‍රඥප්තියට අදාළ රීති පනවා ඇත්තේ මැයි මස 13 දිනෙන් නිකුත් වූ අතිවිශේෂ ගැසට්ටුවෙන් බව වාර්තාවේ. මේ නීතිය අනුව සමිති කටයුතු කළහොත් මේවන විට කාරක සභික ධුර දරන්නන්ගෙන් 90% කට පමණ නැවත පත් විය නොහැකිවනු ඇති බව උපකල්පනය කළ හැකිය. මෙමගින් සමිතිවලට සිදුවිය හැක්කේ වර්ධනයක් ද? පරිහානියක් ද? ඒ නිසා දැනට සම්මත අතුරු ව්‍යවස්ථා නියමයන් හා රීති අනුව මහා සභාවේ අයිතියට ඉඩදෙමින් නව රෙගුලාසි නොසලකා කටයුතු කළ යුතුය. එසේ කිරීමෙන් පසුව සිදුකරන නීතිමය ක්‍රියාමාර්ග ඇතොත් ඒවාට මුහුණ දීය යුතුය. පළාතේම ඇති සමිති මේ අනුව කටයුතු කිරීම මහජන අයිතියට හිස නැමීමකි. මානව හිමිකම් කඩවීමක් මෙමගින් සිදුවන බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සියලුම සමුපකාර සමිති එක්විය යුතු අවස්ථාවකි.

1973.12.26 දින පනවන ලද රීතිවල තිබූ වසර 3 ක සීමාව මෙහි ආදීනවයන් වටහා ගැනීමෙන් පසුව 1980.06.20 හා 1981.01.25 දිනෙන් නිකුත් කළ අංක 94 හා 125 යන ගැසට් නිවේදනයන් ගෙන් ඉවත්කරන ලදී. එසේම වසර 108 ක් තිස්සේ විකාශය වූ පනතේ විධානයන් නොසලකා එම පනතින් ඉවත් කරන ලද වගන්ති මෙම පළාතේ ප්‍රඥප්තියට ඇතුලු කරමින් මහජන සංවිධානයක් ලෙස සංවර්ධනය කරනු වෙනුවට දේශපාලන අධිකාරියේ උවමනතාවට කටයුතුකරන නිලධාරීන්ගේ පාලනයට යටත් කර ඇති, සාමාජික ප්‍රජාත්‍රන්ත්‍රවාදී පාලනය හා ස්වාධීනත්වය හා ස්වරීත්වය යන ලොව පිලිගත් සමුපකාර ප්‍රතිපත්ති උල්ලංඝනය වන නියමයන් මෙම නීතිවල අන්තර් ගත ය. සමුපකාර අරමුදලේ මුදල් යොදවා සමුපකාර අධ්‍යාපනය කරනු වෙනුවට ඔවුන්ගේ පරිපාලන වියදම් පියවා ගැනීමට අරමුදල් තර කර දීමට සමුපකාර කටයුතු කළ යුතු නැත. කළ යුත්තේ අතිරික්ත අවම කරගනිමින් සාමාජිකයාට වඩාත් සාධාරණය ඉටු කිරීමය. වරප්‍රසාද නොලත් බහුතරයේ උවමනාවන් ඉටු කරමින් අවමයෙන් හෝ පීවන ගැටලු වලට විසදුම් ලබා දෙන සමුපකාරය දැනටත් සුව කළ නොහැකි තරමේ රෝගියෙකුව සිටී. මධ්‍යම රජයේ පනතම සිය පළාත්වල නීතිය බවට පත්කරගෙන ඇති උතුරු හා නැගෙනහිර පළාතේ දේශපාලන අධිකාරිය සමුපාකාර රෝගියා සුවපත් කිරීමට උත්සාහ දරයි. අනිකුත් පළාත්වල ඉන්නා සමුපකාරය අවශ්‍ය නොවන වරප්‍රසාද භුක්තිවිදින පන්තියට ගැනෙන දේශපාලන අදිකාරීය මෙන්ම වරප්‍රසාද හිමි යටත් නිලධාරී පැලැන්තියන් රෝගියාගේ මළගම කඩිනම් කරයි.

සමුපකාරයෙන් එල ප්‍රයෝජනයක් අත්නොවන පාලකයින්ට එහි අභිවෘද්ධියට කළ යුත්තේ කුමක්දැයි නොවැටහෙන නිසා සමුපකාර නීතිරීති සෑදිය යුත්තේ එම ව්‍යාපාරයේ නිරතවන්නන්ගේ අදහස් සැලකිල්ලට ගෙන ඇති බවට අන්තර්ජාතිකව එකගවී ඇති නියමයන් අපේ රටේ ඇත්තන් නොසලකා හැරීමේ කරුමය රටම උරුම කරගනී. මේවාට නැගීසිටිමින් සමුපකාර ප්‍රතිපත්ති ආරක්ෂාවන පරිදි කටයුතු කිරීමට නායකත්වය අවංකවම කැපවිය යුතුය.

## සී.ස. උද්‍යාන සණස සමිතිය

### අභිමානවත් 25 වන රිදී ජුබිලිය සමරයි






දෙහිවල-ගල්කිස්ස කලාපයේ සමිති අතර ඉදිරියෙන් සිටින සී.ස. උද්‍යාන සණස සමිතිය සිය අභිමානවත් 25වන සංවත්සරය උත්සවය පසුගියදා දින කරගම්පිටිය සණස ඩැනිසන් වීරසුරිය ශ්‍රවණාගාරයේදී උත්සවාකාරයෙන් සැමරීය. 07 පිටුවට...

## වෙසක් මංගල්‍ය නිමිත්තෙන් පැවැත්වු විශේෂ ධර්ම දේශනාව



වෙසක් මංගල්‍ය නිමිතිකොට ගනිමින් රාජගිරිය නැගෙනහිර සණස සමිතිය මගින් පසුගියදා කොළඹ 10 පන්සලවත්ත විහාරස්ථානයෙහි ශ්‍රී බෞද්ධාරාම අධිපති විචිත්‍ර ධර්ම කථික සද්ධර්ම ශ්‍රී ශාසන සෝභනී ශාස්ත්‍රපති ලුණුගම් වෙහෙරේ විමල නන්ද හිමි විසින් විශේෂ ධර්ම දේශනාවක් සණස ශ්‍රවණාගාරයේ පවත්වන ලදී. 07 පිටුවට...



# මුදල් ක්‍රියාවේ පදනමයි

ජීවිතයට ඇතුවත් මදි, නැතුවත් මදි ‘මුදල්’ යනු කුමක්ද? මුදල් නිසා වරෙක උද්දාමයෙන් හැසිරෙන්නා තමත් වරෙක සන්තාපයෙන් හැසිරෙයි. එසේම මුදල් නිසාම වටිනා ජීවිත පවා අහිමිකරගත් අවස්ථා එමටය. එසේනම් මුදල් ඉන්ද්‍රජාලිකයෙක්ද? නැතහොත් සාරෞෂධයක්ද? සමහරෙකු ‘සල්ලි දෙවියන්ගේ මල්ලි යැයි’ පවසනවා අසා ඇත්තෙමු.

‘ජේම්ස් බෝල්ඩ්වින්’ මුදල් ගැන මෙසේ පවසා ඇත. ‘මුදල ඉඳුරාම ලිංගික රමණය වැනිය’ සතුට, ප්‍රේමය, හෝ ශාරීරික සුවතාවය මෙන්ම මානසික සුවතාවය මුදලට ගත නොහැක. ඔබේ බුද්ධි මට්ටම, දක්‍ෂතාව, දැනුම මැන ගැනීමට මුදලට නොහැක. ධනවත් මුග්ධයෝ මෙන්ම දුප්පත් විදග්ධයෝ ද වෙති. එහෙයින් සරලව ගතහොත් මුදල් යනු උපරණයක් මෙන්ම ආයුධයකි. යහපතට සේම අයහපතටද මුදල් යෙදිය හැක. ආවේගී ආරෝපණයක් ඇති කරන මුදල් පිළිබඳව කතා කරනවිට නයාට අඳුකොල මෙනි. ගණනය නොකරන මුදලක් නැත. වියදම් රටාව ඔබේ අවශ්‍යතා සහ සැබෑ ඇගයීම් අනාවරණය කරනු ලබයි.

මුදල හුදෙක්ම ක්‍රියාවේ පදනම බව අපි විශ්වාස කරමු. එම ක්‍රියාවන් ජීවිතය තුළින් අප ලබන ප්‍රථිඵල වල හේතුව වේ. මුදලට කෙනෙකු තුල ඇති පෞද්ගලික සම්බන්ධතාව සෙවීමේදී නොයෙකුත් ප්‍රතිඵල නිරාවරණය වේ. සීමිත විශ්වාස උපයා දෙන්නේ සීමිත මුදලක් පමණි. මුදල් ඉපයීමට බොහෝ වෙහෙස මහන්සි වී වැඩකළ යුතු යැයි සිතන්නේ නම්, පොහොසත් වීම සඳහා සුවපහසු කාලයක් ගත කරනු ඇතැයි කිසිසේත්ම අපේක්‍ෂා කළ නොහැක. මුදල් විනාශකාරී දෙයකැයි තවත් කෙනෙකුට සිතෙනු ඇත. විශාල වටිනාකමක් ඇති මුදල් ලඟ තබා ගැනීම මානසික අසහනකාරී තත්වයකට පත් කරන්නකි. මුදල් කළමනාකරණය කර නොගත හොත්, ලොතරැයි පතක ජයග්‍රාහකයෙකු උවද අන්ත අසරණ තත්වයට පත්වීමට හෝ ජීවිතය අවදානමකට ලක් වීමකට හෝ බොහෝ සේ ඉඩ ප්‍රස්ථා තිබේ. සමාජගත තොරතුරු ඒ සඳහා එමට ඇත.

අප වටා ඇති මුදල්, ගලා යන කාණු හරිහැටි හඳුනා නොගත හොත්, දුර්වල ජීවියෙකු සේ කල් හැරීමට සිදුවනවා නොඅනුමානය. ආවේගික අවශ්‍යතා සඳහා පමණ ඉක්මවා වියදම් කිරීම, සංස්කෘතික වශයෙන් ජනමාධ්‍ය මගින් දිරිමත් කරමින් යම්කිසි උපකරණයක්, ද්‍රව්‍යයක් තමාගේ කර ගැනීමට දරණ වෑයම, ඒ සඳහා හඳුන්වා දෙනු ලබන ණයපත් සඳහා බැංකු මගින් කාඩ්පත් හඳුන්වා දීම වැනි, ව්‍යවසායක උත්තේජන ඇතිකිරීම වැනි උපාය ශීලී ක්‍රමයන්ට ගැති වීමෙන්, තමා සතුව ඇති මුදල් නොදැනීම පිටතට ගලායෑම සිදුවන බව පසක් කළ යුතුය.

ස.ණ.ස. ක්‍රියාවලියේදී අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා සාමාජිකයින් පොළඹවා ඇත්තේ, නොදැනී ගලායන මුදල් එක් තැනකට ඒකරාශී කිරීමටත්, ණය බරින් හෙම්බත් වී ඇත්තෙකුට මදක් හෝ පවන් සැලීමක් එමගින් සිදුවෙතැයි යන උපකල්පනය ඇතිවය. එදිනෙදා ජීවිතයේ පරිහරණයට ගතයුතු උපකරණ හෝ ද්‍රව්‍ය ලබා ගැනීමෙන්ද, ආවේගී අවශ්‍යතා පලවා හරිමින්ද, අපිස් ජීවන සැළසුමකට අවතීර්ණ වීමට ස.ණ.ස. තෝතැන්නකි. ඔබද එහි කොටස් කරුවෙකු බැවින්, සතුට සඳහා ණය බරින් මිදී සිත සනහා ගන්න.

**ස.ණ.ස. පුවත් කොළඹින්**

☆ **අධීක්ෂණය**
ඩී. වීරසූරිය
තුසිත් කුමාර වීරවර්ධන

☆ **ප්‍රකාශන කමිටුව**
සී. ගමගේ
එම්.ඩී. ජිනදාස
හේමසිරි බෙනරගම
එම්.රොහාන් ජේ. පෙරේරා
යු.ඩී.එස්. වීරසිංහ

☆ **විධායක සහාය**
නාලක ජයසූරිය

☆ **පරිගණක අක්ෂර හා සැලසුම**
කේ. ඒ. සම්පත් ප්‍රසංග

**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමය**
**220/1, හයිලෙවල් පාර, මහරගම.**
**දු.ක. 0112 851213, 0112 848801, 0114 301228**
sanasacolombo@gmail.lk



# අනන්‍යතාවය පිළිබඳව ඔබ සැලකිලිමත් ද?

**තුසිත් කුමාර වීරවර්ධන**
**සාමාන්‍යාධිකාරී කොළඹ දිසා. සංගමය**

ඕනැම ව්‍යාපාරයකට අනන්‍යතාවයක් ඇත. එසේම සණස ව්‍යාපාරයට ද අනන්‍යතාවයක් ඇත. මොකක්ද මේ අනන්‍යතාවය කියන්නේ. බොහෝ අය මෙම අනන්‍යතාවය පිළිබඳව කථා කලද යම්කිසි ව්‍යාපාරයක අනන්‍යතාවය පිළිබඳව නිසියාකාර වැටහීමක් නොමැත.

ඕනැම ව්‍යාපාරයක අඛණ්ඩ හා දීර්ඝකාලීන පැවැත්ම සඳහා මෙම ව්‍යාපාරික අනන්‍යතාවය පිළිබඳව අවධානය යොමු කල යුතුම වෙනවා. එසේනම් ව්‍යාපාරික කළමනාකරණයට අදාල අනන්‍යතාවය යනුවෙන් හඳුන්වන්නේ කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් වෙළඳපල තුල ඇති අනෙකුත් භාණ්ඩ හා සේවා වලින් වෙන්කොට හඳුනා ගැනීම සඳහා එම භාණ්ඩ හා සේවාවලට ඇති විශේෂිත ලක්ෂණ එනම්, සුවිශේෂීතාවය එහි අනන්‍යතාවය ලෙස අර්ථකථනය කල හැකියි. මෙම අනන්‍යතාවය ගොඩනැංවීම සඳහා ප්‍රධාන වශයෙන් යොදා ගනු ලබන්නාවූ සාධක කිහිපයකි.

1 සන්නාමය

වෙළඳපල තුල සිටින විවිධ පාර්ශ්වයන්ගෙන් තම නිෂ්පාදනය හෝ සේවාව වෙන්කර හඳුනා ගැනීම සඳහා යොදා ගනු ලබන්නාවූ දෘෂ්‍යමාන සංකේතයක් හෝ අක්ෂර කාණ්ඩයක් සන්නමක් ලෙස හැඳින්වේ.

මේ අනුව සන්නාමය කොටස් දෙකක් යටතේ හඳුනාගත හැකිය.

1 සන්නම් නාමය 2 සන්නම් ලකුණ

1978 වර්ෂයේ සිට මේ දක්වා පුරා වර්ෂ 40 කට අධික කාලයක් ‘සණස’ යන සන්නම් නාමය අඛණ්ඩව පවතී. එසේම ‘සණස’ සන්නම් ලකුණ ශ්‍රී ලංකාවේ ඕනෑම තැනක දුටු පමණින් හඳුනා ගැනීමට ඕනැම කෙනෙකුට අපහසු නැත. නමුත් වර්තමානයේ යම් යම් කොටස් මෙය විකෘති කරමින් විවිධවූ අනන්‍යතාවයන් ගොඩනංවා ගැනීමට උත්සාහකරයි. නමුත් බොහෝ කාලයක් කැපකිරීමෙන් හා උත්සාහයෙන් ගොඩනඟා ගත් සන්නාමයෙන් ප්‍රයෝජනය ගනු ලබන්නේ කීයෙන් කීදෙනාද ?

2 සාමාජිකයා

මෙය මෙම ව්‍යාපාරයේ අනන්‍යතාවය ගොඩනංවා ගැනීමට දායක වී ඇති දෙවැනි සාධකයයි. ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් සෘජුව හා වක්‍රව 25% කට වඩා වැඩි ජනගහනයක් සමස්ත සණස ව්‍යාපාරය තුල සිටී. මින් අප නියම ඵල ප්‍රයෝජන රැගෙන තිබේ ද ? මෙවැනි ජනතාවක් ඒකරාශීකරණය කර ගත හැකි තවත් ව්‍යාපාරයක් තිබේද ? නැත. සෑම මසකම මහසභා හරහා ඒකරාශී වෙමින් දෛනික ගණුදෙනු ක්‍රියාවලිය තුල සක්‍රියව දායකවීම සුවිශේෂී ලක්ෂණයකි. එසේම ළමා සාමාජිකයාගේ සිට තරුණ සාමාජිකයා දක්වා ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැතිව ඒකරාශි වෙමින් පවතින එකම ස්ථානය සණස යන සන්නාමයයි. මෙය කෙතරම් දුරට රටේ ආර්ථික සමාජීය සහ සංස්කෘතික සංවර්ධනයට ඵලදායී ලෙස යොදා ගෙන තිබේද යන්න පිළිබඳව ඉතා ගැඹුරින් සිතාබැලිය යුතු කාලයකි. මෙහි තිබෙන ශක්‍යතාවය ඉතා හොඳින් දන්නා බාහිර සමාගම් මින් ඵල ප්‍රයෝජනය ලබා ගැනීම සඳහා උත්සාහ කරන නමුත් ව්‍යාපාරයක් ලෙස එකී ජාතික වැඩ පිළිවෙලක් තවමත් සකස් වී නොමැත.

3 ප්‍රාථමික සමිති

මෙය ද ඉතා දුෂ්කරව ගොඩනඟාගත් ව්‍යාපාරයේ අනන්‍යතාවය පෙන්නුම් කරනු ලබන තවත් සාධකයකි. නිල නොලත් සංඛ්‍යා ලේඛණවලට අනුව මුළු දිවයිනේම දැනට සණස සමිති 8000 කට ආසන්න ප්‍රමාණයක් පවතී. සමහර සමිති ඉතා ශක්තිමත්ව අනෙකුත් මූල්‍ය ආයතනවලට තරඟකාරීත්වයක් ලබාදෙමිනුත් ඉතාහොඳින් පවත්වා ගෙන යනු ලබයි. එසේම තවත් සමිති සමාජ සුභසාධනයට මූලිකත්වය දෙමින් මූල්‍ය ගණුදෙනු වල නිරත වෙයි. කෙසේ වුවත් ව්‍යාපාරයට මෙය බලවත් ශක්තියකි. නමුත් අවාසනාවකට මෙහි තිබෙන නියම ශක්තිය ජාතික වශයෙන් ප්‍රකාශයට පත්නොවෙයි. මෙම සමිති තුලින් ආර්ථිකයට එක්කරනු ලබන ණය සහ තැන්පතු ප්‍රමාණය අතිවිශාලය. ඒ තුලින් ජනිත වන නිෂ්පාදනයන් ද විශාල ප්‍රමාණයකි. මෙය වෙනම විකල්ප අර්ථ ක්‍රමයකි. නමුත් එය ඇගයීම සඳහා අවශ්‍ය ජාතික වැඩපිළිවෙලක් තවමත් නොමැත. මෙම කරුණ ද අපගේ අනන්‍යතාවය ජාතික තලයට ගෙන ඒමට තිබෙන බාධකයකි.

4 කාන්තා සහභාගීත්වය

මා සොයාගත් ආකාරයට මෙම ව්‍යාපාරය තුල 80% ක් පමණ ප්‍රතිශතයක් කාන්තා නියෝජනය දරනු ලබයි. නමුත් එය ද නිසිලෙස ඇගයීමට ලක් කරමින් අනන්‍යතාවය ඉස්මතු කිරීමට අවශ්‍ය වැඩසටහන් නොමැත. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පිළිබඳව මුළු ලෝකයම අද දිනයේ කථා කරයි. නමුත් මෙම ව්‍යාපාරය තුල එය ඕනෑ තරම් දක්නට ලැබේ. අවාසනාව වන්නේ ඔවුන්ගේ නායකත්වය ජාතික මට්ටම කරා රැගෙන ඒමට අවශ්‍ය වැඩ පිළිවෙලක් ජාතික වශයෙන් නොමැතිවීමයි. මෙම දුර්වලකම ද අපගේ අනන්‍යතාවය ලෝකයට ගෙන යාමට තිබෙන තවත් එක් බාධකයකි.

5 සෑම මසකම පවත්වනු ලබන මහසභා

මෙවැනි ජන සමූහයක් සෑම මසකම එක්වෙන තවත් ව්‍යාපර තිබේද ? මෙය අපගේ අනන්‍යතාවයයේ ප්‍රබල සාධකයකි. නමුත් මින් අප නියම ඵල ප්‍රයෝජන රැගෙන තිබේද ? සිතාබලන්න. මුළු සමාජයකම අයහපත් ආකල්ප දුරු කරලමින්, යහපත් ආකල්ප ඇති කිරීමට කෙතරම් වෙහෙස වියයුතු ද? කෙතරම් පිරිවැයක් දැරිය යුතු ද? නමුත් කිසිඳු පිරිවැයක් නොදරා මෙම මහාසභාවන් තුලින් මෙම කාර්ය ඉතා සරලව සිදුකරලීමට හැකිය. එය කිරීමට නම් මෙම සියළුම රැස්වීම් ඉතා ඵලදායී ලෙස පවත්වමින් ඒ තුලින් යහපත් ආකල්ප සහ සාරධර්ම සමාජයට යවනු ලබන මාධ්‍යයක් කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙලවල් සිදු කළ යුතුය.

07 පිටුවට...

## යතුරුපැදි විකිනීම සඳහා මිල ගණන් කැඳවීම


බජාජ් බොක්සර් WP UV 7954 ලියාපදිංචි වර්ෂය 2008
බජාජ් කැලිබර් WP JD 2917 ලියාපදිංචි වර්ෂය 2004
ටීවීඑස් අපාචි WP BED 5390 ලියාපදිංචි වර්ෂය 2016

යතුරුපැදි පරීක්ෂාකර ඔබගේ මිලගනන් 2019.07.12 දිනට පෙර සණස සංගමයේ ප්‍රධාන කාර්යාලය වෙත ලබාදෙන්න. වැඩිම ඉල්ලුමට යතුරුපැදි ලබාදීමට කටයුතු කරනු ඇත.

**සී.ස. කොළඹ දිස්ත්‍රික් සණස සංගමය**
**නොː 220/1, හයිලෙවල් පාර,**
**මහරගම.**
**දුරකථනː 0113 699600**

**කොන්දේසි සහිතයි.**

## 25 වසරක සේවය ඇගයීමක්



දෙහිවල නැදිමාල සමන් මාවතේ නිවසක සාමාජිකයින් 15 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 1994 මාර්තු මාසයේ ආරම්භකරන ලද සී.ස. උද්‍යාන සණස සමිතියේ ආරම්භක සාමාජිකයා වශයෙන් (සා.අංක 01) ගමන් ආරම්භකල සාමවිනිසුරු එම්.එම්. ලයනල් මහතාට කරන උපහාරයයි මේ.

1995 වසරේ සමිතියේ භාරදුර කාර්යක් වන භාණ්ඩාගාරික දුරය දරමින් අඛණ්ඩව වසර 23ක් පමණ කාලයක් එම නිලයේ වැඩ බැලීය. 25 වන සංවත්සර සැමරුමේදී ඉල්ලා අස්වීමට තීරණය කල අතර, වසර 25ක් සමිතිය වෙනුවෙන් වෙහෙස වී, වයසත් සමග ඇතිවන අපහසුතා මත එම තීරණය ගත්බව දැන්වීය. ඉදිරියේදී සාමාජිකත්වයේ රැදී සිටිමින් අවශ්‍ය අවස්ථාවන් වලදී සහය දීමට කැමති බව දැන්වීය.

ගරු මහත්මයාණනි, ඔබ කල සේවය මිල කල නොහැක. ස්වෙච්ඡාවෙන් සමාජයේ උන්නතිය වෙනුවෙන් ඔබ කල සේවය සදා මතකයේ රැදෙනු ඇත. මෙම කෙටි සටහන ඔබ කල සේවය ඇගයීමටයි.

**ප්‍රසාද් විජේවර්ධන - උද්‍යාන සණස වාර්තාකරු**

## ජලය සුරකිමු



ගංගා, මුහුදු, වැව්, පොකුණු හා වර්ෂාවෙන් අපට ජලය ලැබේ. අපට නෑමට, බීමට, රෙදි සේදීමට යන ආදියට ජලය අවශ්‍ය වේ. එමෙන්ම ජලය ආශ්‍රිත කර්මාන්තද බිහිවේ. උදාහරණ වශයෙන් ධීවර කර්මාන්තය, කෘෂි කර්මාන්තය, ලුණු කර්මාන්තය වේ. ජලය හොදසේම නරක වන අවස්ථා ද ඇත. ජලයෙන් මිනිසුන්ටද හානි වේ. සුනාමිය, ගංවතුර ආදියයි. ජලය අපිරිසිදු වන ආකාර රාශියකි. ඒවානම් වාහන සේදීම, කර්මාන්තශාලා වලින් අපද්‍රව්‍ය එක්වීම, ජලයට කුණු කසල යෙදීමෙන් ජලය අපිරිසිදු වේ.

ජලය දූෂණය වුවහොත් තිබෙන ජල ප්‍රමාණයද කෙමෙන් කෙමෙන් අඩුවේ ගස් කැපීමෙන්ද ජල උල්පත් සිඳේ. දැන් සිටින මිනිසුන් ගස් කැපීමට පෙළඹී ඇත. ජලය ආරක්ෂා කිරීමට අරපිරිමැස්මෙන් පාවිච්චි කිරීම, ජලයට අපද්‍රව්‍ය බැහැර නොකිරීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආදිය වැදගත් වේ. අපි ජලය විනාශ කළහොත් අනාගත පරපුරට කිනම් සරණක්ද?

**ඩබ්.එච්. සනුක සන්සිළු**
**වල්පොල සණස**
**රන්තරු ළමා සමිතිය**

## රජෙකු නැති පළගැටියා

පළගැටියන්ට උන් පාලනය කරන රජෙක් නැත. එහෙත් උන් සියල්ලෝ කණ්ඩායම් වශයෙන් පිටත්ව යති. රජෙකු නැති මේ පළගැටියෝ එකට ගමන් කරන විට, සමුහයා ලෙස විනයානුකූල ලෙස ගමන් කරති. මඟපෙන්වීමක් නැතත් එකිනෙකා තම තමාව නිවැරදිව හසුරුවා ගනිමින් ක්‍රියා කරයි. මේ අනුව බලන කල පළගැටියන් පිළිවෙලක් ඇති හමුදාවකි. අපට ඉගෙනීමට පාඩමක් ඇත.

මනුෂ්‍යයන් වන අපද මඟ පෙන්වන්නෙක් හෝ අවවාද දෙන අයෙකු නැතිවිට, අපට ඊසි මාර්ගයන්හි ගමන් කොට ඉමහත් දුෂ්කරතාවයනට මුහුණපාන අවස්ථා සුලබය.

''පහන් සිළුවට ලොබ බැද තම ජීවිත විනාශ කරගන්නේ පළගැටියන් පමණක් නොවේ.' යන කියමන අවවාදාත්මක ස්වරූපයෙන් අපි අසා ඇති මුත්, පළගැටි කණ්ඩායමේ අකීකරු තනිව සිටින පළගැටියන් පමණක් අර්බුද වලට ගොදුරු වී ඇත.

සණස නම් වූ අපද කණ්ඩායමකි. අපි එකිනෙකා තම තමාව හසුරුවා ගැනීමට නිරන්තර පුරුදු පුහුණු විය යුතු වෙමු. මන්ද සත්ව ලෝකයේ ඉතා කුඩා වූ කෘමියකු ලෙස නම් දරණ 'පළගැටි' ආදර්ශය ගෙන හෝ, අපි දන්නා වූ, ඇසුවා වූ සියලු දේ යහපත් ලෙස පිළිපදිමින් විනයෙන් යුතුව ක්‍රියාකිරීමට අපි පුරුදු වෙමු.

**තුසීමා අමරතුංග කාන්තා සමිතිය හත්බෝධිය ලේකම්**

## බටහිර ඉඳිබැද්ද සමිතිය රැස්වීම් ශාලාව විවෘත කිරීම.



අපගේ සණස රැස්වීම් ශාලාව කොළඹ දිසා සංගමයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුල්‍ය) ලක්ෂ්මන් අමරතුංග මහතාගේ ප්‍රධානත්වයෙන් විවෘත කරන ලදී.

එම අවස්ථාව සඳහා දිසා සංගමයේ පර්ෂද කළමණාකරු අසල්වාසී ස.ණ.ස. සමිතිවල ගරු සභාපතිවරුන්ද අප සමිතියේ හිටපු ගරු සභාපති ඇතුළු කාරක සභාව හා කමිටු නිළධාරින්ද සහභාගි වූ අතර ස.ණ.ස. සාමාජිකයින්ද මෙම සුභ මොහොත සදහා සහභාගි වූහ. පසුදින සාංඝික දානමය පිංකමක් සිදුකරන ලදී.

**කළමණාකාරිණි**
**බටහිර ඉඳිබැද්ද සණස**

## ගෙවතු වගාවට මග





**බෝග සිටුවීම**

අපේ පාරම්පරික වගාවේදී බෝග සිටුවන දිනයන්

1. මුල් ආහාරයට ගන්නා බෝග - ඉරිදා (අල වර්ග)
2. කැඳ ආහාරයට ගන්නා බෝග - සඳුදා
3. කොළ ආහාරයට ගන්නා බෝග - අඟහරුවාදා, සෙනසුරාදා
4. මල් හටගන්නා බෝග - බදාදා
5. ගෙඩි ආහාරයට ගන්නා බෝග - බ්‍රහස්පතින්දා, සිකුරාදා

**සිටුවීමට කාලය**

අල බහින ශාක සවස් කාලයේ,
මල් හා ගෙඩි හටගන්නා බෝග උදයවරුවේ.

**උෂ්ණ අධික අල හා ශීත ගුණය ඇති අල වර්ග හදුනාගන්නේ මෙසේය.**

දකුණට දුවන වැල් ඇති අල වර්ග උෂ්ණ අධිකය. ඒවා සූර්ය වංශයට අයිතිය
වමට දුවන වැල් ඇති අල වර්ග සීතය. ඒවා වාද වංශයට අයිතිය.
සදනු රිවි දින මුල් කැමති ගස්
සඳුදිනේ කඳ මහත රැක්මේ.
යොදනු කුජ,ශනි, දෙදින කොල ලැබ ගන්නට
ගස් බුද මලින් වැඩිවේ
දෙදින ගුරු කිවි පළ දරණ ගස් නොහොත් මහරුක් වලට ගුණවේ.
මෙදැන සත්දින සදනු රුක් පැල පතා තම සිත විලස වැඩවේ.

**(කටුබැද්ද මෙරිල් ජේ. ප්‍රනාන්දු පදනමේ දැනුම ඇසුරෙනි)**

**බී.ඒ. ශ්‍රියානිමාලා**
**කුඩුවාමුල්ල සණස වාර්තාකාරිනී**


**නිවැරදි කිරීමක්**

**පොඩ්ඩොත් එක්ක Media**

මෙහෙයවීමː **ඉන්දික දුෂාන්ත කෝරාළගේ**
0716726424, 0777127890

# ක්‍ෂුද්‍රමූල්‍ය ණය මුදාහැරි ප්‍රථම මූල්‍ය සංවිධානය ස.ණ.ස. සමිතිම වේ.

ඩී.එම්. ප්‍රනාන්දු - ප්‍රධාන විධායක නිළධාරි, ජාතික ස.ණ.ස. සංධානය

දරිද්‍රතාවයෙන් පෙලෙන අය විසින් දුප්පත් කම නිර්මාණය කලා නොව, ඔවුන් එයට ගොදුරු වී ඇත. අප රට තුල පවත්නා ආර්ථික හා සමාජ ක්‍රමය තුලින් දරිද්‍රතාවය නිර්මාණය වී ඇත. නිරපේක්ෂක දරිද්‍රතාවට මුහුණ දුන් අය වෙත ඉතිරිව ඇති අවසාන බලාපොරොත්තුව වන්නේ ණය වන අතර, එය ඔවුන්ගේ මූලික අයිතිවාසිකමක් ලෙසද පිළිගත යුතුව ඇත.

මෙම ක්‍ෂුද්‍රමූල්‍ය ණය නිදහස් කිරීම කෙරෙහි, දිගු කාලක සිට, වරින්වර පත්වූ රජයන් විසින්, රාජ්‍ය හා රාජ්‍ය නොවන බැංකු හරහා මෙම ණය ක්‍රමය ක්‍රියාත්මක කලද, ලැබී ඇති ප්‍රතිඵල දුප්පත් ජනතාවගේ දරිද්‍රතාවය අඩකින් හෝ අඩු කිරීමට හේතු වී ඇත්නම් සතුටු විය හැක.

එසේ නොවීමට හේතු වී ඇත්තේ, රාජ්‍ය ප්‍රතිපත්තියේ හෝ මූල්‍ය සම්පාදනය කරන ආයතන වල ප්‍රතිපත්තින්හී ඇති අනියම් යටි අරමුණු ඉටුකර ගැනීමට එමගින් අපේක්‍ෂා කිරීමය. රජය, ඔවුන්ගේ ඡන්ද ගොඩ වැඩිකර ගැනීමටත්, මූල්‍ය ආයතන, රජයේ නියෝග නිසා ඉදිරිපත් වුවත්, ඔවුන් අපේක්‍ෂා කරන්නේ ඔවුන්ගේ ලාභය, ගොඩනගා ගැනීමටත්ය.

ශ්‍රී ලංකාවේ ණයදෙන සමිති ව්‍යාපාරය සුදු පාලකයින් විසින් ආරම්භ කලේම, ණය බරින් ගොවි ජනතාව මුදා ගැනීමේ අරමුණ ඇතිවය. එසේ වුවත්, ඉන් වසර 113ක් ගෙවී අද දිනයේද, ණය ලබාගත් අයගේම අදුරදර්ශී ණය පරිභෝජනය නිසා සහ ණය ලබා ගැනීමත් සමගම, ඔවුන් මාසිකව කිනම් හෝ මුදලක් ඉතිරි කිරීමේ පුරුද්ද අත්හැරීමත්, නිසා ඔවුන් ණය බරින් නිදහස් වීම සිහිනයක් බවට පත් කරගෙන ඇත.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ක්‍ෂුද්‍රමූල්‍ය ණය බෙදා හැරීම, රාජ්‍ය හා රාජ්‍ය නොවන බැංකු මගින් මෙන්ම බහුතරයෙන්ම සිදු වන්නේ රජයේ ලියාපදිංචියද නොලත්, පුද්ගල ක්‍ෂුද්‍රමූල්‍ය සමාගම් මගිනි. ඔවුන් වැඩි වශයෙන්ම දායක කරගෙන ඇත්තේ ගැමි කාන්තාවන්වය. මෙම කාන්තාවන්ගේ අති විශාල බහුතරයක් නුගත් අය බැව් සදහන් කලොත් නිවැරදිය.

බොහෝ පළාත් වල මෙම ණය ලබාගත් කාන්තාවන්ගේ ස්වාමිපුරුෂයන් පවා නොදැන, ණය බෙදාහරින පුද්ගල සමාගම් නියෝජිතයන්ගේ කථා බහට මුලාවී ක්‍රියාකිරීම නිසාම, පවුල් අවුල් කරගෙන නීතියේ රැහැනට හසුව, ඇතැම්විට ජීවිත අහිමි කරගත්, අසරණ ගැමි කාන්තාවන්ද නැත්තේ නොවේ. බොහෝ අවස්ථා වල ස්වාමිපුරුෂයාගේ අවශ්‍යතා සදහා බිරිඳ ඉදිරිපත් වී ලබාගන්නා ණය මුදල, ස්වාමි පුරුෂයාගේ නොපනත්කම් ඉටුකර ගැනීමට ක්‍රියා කිරීමෙන්, මෙන්ම, අසාර්ථක ව්‍යවසාය කටයුතු සදහා යොදා ගැනීමද, මෙසේ ලබාගත් ණය ආපසු ගෙවා ගැනීමට නොහැකිව, සිය පවුල් විසිරී ගිය තැන්ද අසන්නට ඇත.

1978 ගණන් වලදී, ශ්‍රී ලංකාවේ එවකට පැවති ණය දෙන සමුපකාර සමිති, සංඛ්‍යාව වර්ධනය කර ශක්තිමත් කරන්නට නායකත්වය ගත් පුද්ගලයන්ද, තම යටි අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියා කරමින්, සාමුහික සමුපකාර ප්‍රජා සංවිධාන, වලපල්ලට තල්ලු කරමින්, එය තම පවුල් ජාලයට රැකියා සම්පාදනයට මෙන්ම, ඔවුන්ගේ සාක්කු පුරවා ගැනීමට හැකි වන වටාපිටාව සැකසීමේ ප්‍රතිපලයක් වශයෙන්, ලාබ ඉපයීමම මූලික ගරගත්, පුද්ගල සමාගම් ජාලයක් 'සණස' නාමය කරපින්නා ගෙන පවත්වාගෙන යන්නට ක්‍රියා කර ඇත. එහෙත්, එම සමාගම් ද, තනිකරම පුද්ගල ප්‍රාග්ධනයේ වර්ධනය තුළ, ඒ ඒ පුද්ගලයන්ටම සතුවීමට ගතවන කාලය වැඩි ඈතක නොවේ. එසේ වීමට ඉඩ හරිමින් ස.ණ.ස. යනුවෙන් එයට උරුමකම් හිමි අය, එනම් භාවිතා කිරීම, නීති විරෝධී යනුවෙන් එම නායකයින් ප්‍රකාශ කිරීම, කෙතරම් නිහින කමක්ද යන්න, තතු දන්නෝ මැනවින් අවබෝධ කරගනු ඇත.

කෙසේ වෙතත්, සණස දිස්ත්‍රික් සංගම් වශයෙන් සංවිධානගතව, සිය සාමාජිකයන් වන, ප්‍රාථමික ස.ණ,ස. සමිතින්හි බහුතර සාමාජිකත්වය වන, කාන්තාවන් සහ එම ස.ණ.ස. කාන්තා සංවිධාන වලට ශක්තියක් වෙමින්, ඔවුන්ට සමුපකාර නීතිය සහ සමිතියේ ක්‍රියාකාරී නීති පිළිබදව සන්නද්ධ කරමින්, සණස තුළින්ම ඔවුන්ගේ ආර්ථිකය ගොඩනගාගෙන, පවතින දරිද්‍රතාවයෙන් මිදෙන ආකාරයට, ඔවුන්ගේ අවශ්‍ය ප්‍රායෝගික දැනුම මෙන්ම, ක්‍ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් ලබා දීමට උත්සුක විය යුතුව ඇත.

මේ සදහා ප්‍රථමික ස.ණ.ස. සමිති බලධාරීන් මෙන්ම කාර්ය මණ්ඩල නිළධාරීන් සිය සාමාජිකත්වය කරා ලඟටම ගොස්, ඔවුනට අවශ්‍ය ව්‍යවසාය දැනුම ලබාදී, ඒ අනුව ඔවුනට අවශ්‍ය ණය අවශ්‍යතාවයන්, ලිහිල් මෙන්ම, සරල ඇප කොන්දේසි තුල ක්‍රියාත්මක කරමින්, ණය ආපසු අයකර ගැනීමද, ඔවුන් සමීපයටම ගොස් දායකත්වය ඇතිව සංවිධානගත වීමට ක්‍රියා කල යුතුව ඇත.

එමෙන්ම, මෙම ක්‍ෂුද්‍රමූල්‍ය ණය ආයෝජනය තුල ක්‍රියාත්මක කරනු ලබන, ව්‍යාපෘතිවල නිෂ්පාදන හෝ අස්වැන්න අලෙවි කර ගැනීම ගැණුම් කරුවන් වශයෙන් අනිකුත් සාමාජිකයන්වම යොමු කර ගැනීමටත්, ඉනුත් අතිරික්තය වේ නම්, ඒ සදහා වෙළඳ පොල සපයා දීමටද, ණය ආයෝජකයන් පෙරමුණ ගත යුතුය.

වාර්ෂික ජාත්‍යන්තර සමුපකාර දිනය සමරණ මෙම ජූලි මාසය තුළම, මෙවැනි පරිවර්තනයකට, ප්‍රාථමික සණස සමිති යොමු කරවීමටත්, ඒ සදහා අවශ්‍ය මග පෙන්වීම හා අවැසි මූල්‍ය පහසුකම් වෙතොත්, එය සැපයීමට මෙන්ම, මෙම ක්‍රියා මාර්ගය අධීක්‍ෂණයේ හා නිරීක්‍ෂණයේ කාර්යභාරය තුළ රැඳී සිටිමින්, දිස්ත්‍රික් ස.ණ.ස. සංගම් හි අනිවාර්ය යොමුවීමද අත්‍යාවශ්‍ය වන්නකි.

**ඩී.එම්. ප්‍රනාන්දු**
**ප්‍රධාන විධායක නිලධාරි**
**ජාතික සණස සන්ධානය**



## එකමුතුව

| | |
|---|---|
| මුදලට වහල් වී දිව රෑ කුලල් | කන |
| මිනිසුන් අතර නයි පොළඟුන් සමව | යන |
| පියවර තබන එක මතුවෙන පරිදි | පින |
| සණසෙහි තිබේ සැනසෙමු ඉන් ඉගෙන | දැන |
| | |
| මුදලෙහි අගය මේ යැයි හරිහැටි | හැඳින |
| දිනයේ පැය ගණන නිසි අයුරින් | බෙදින |
| සකසුරුවමට හුරුවී අගහිඟ | මැදින |
| සිරිතෙන් අයින්වෙමු අත පාමින් | යදින |
| | |
| සතුටුව ලද දෙයින් සැනසී සිතන | එක |
| නැණවත් කමේ ලකුණකි හමුනොවන | දුක |
| පිහිටක් වීම කෙනෙකුගෙ නෙත කඳුළු | දැක |
| සසරෙහි ගමන කෙටිවීමකි නොමැත | සැක |
| | |
| මතුවී ගමේ සමඟිය එකමුතුව | යන |
| බලයක් වෙමින් එක්වී එකමඟට | ගෙන |
| දියුණුව දකින්නට මුළුරට | කතා වෙන |
| පෙන්වමු ඔබේ හැකියාවන් | මවිත වෙන |
| | |
| තමනට පමණ නොව පොදුවේ යන | හැඟුම |
| හදවතෙ කිදා ඇත්නම් මියයන | තුරුම |
| කුසලකි උතුම් සුවඳකි විහිදෙන | පුදුම |
| දෙවියන් ගරු කරති මිහිහෙක්සේ | නියම |
| | |
| කවුරුත් එකා මෙන් යහපත පිණිස | ගමේ |
| අත්වැල වෙමින් දම්වැල සමගි | දමේ |
| දියුණුව පතා වෙහෙසී පය ගැසුව | බිමේ |
| කටයුතු කරමු ලොව කාගෙත් සිරස | නැමේ |

**ඈම්. රිචඩ් පෙරේරා සණස නැදිමාල**

## මාදින්නාගොඩ මාදිනු ගොඩ

| | |
|---|---|
| සසරේ පුරුදු ලෙස හදතුල රැව් | දුන්න |
| මගේ පැතුම වුයේ ගමකට කර කාරේ | යන්න |
| කොළඹට නුදුරු ගම්මානෙකි මා දිනු ගොඩ | ඔන්න |
| ආවා හිමි සමග අදරින් ජීවත් | වෙන්න. |
| | |
| කඳු මුදුනක පොඩි පැල්පත මා | පැතුවේ |
| ඒ අතරින් වෙල්යායකි මා | දුටුවේ |
| අප දෙදෙනාගේ ජීවිත හරි | සිහිලක්වේ |
| මා දිනූ ගොඩය පැතූ විලසින් මා | දුටුවේ |
| | |
| බසයෙන් බසින තැන සියඹල | ගසයායේ |
| පාර දෙපස දිළුනේ අගනා වෙල් | යායේ |
| සුළඟට ලෙල දෙස්දී ගොයම පිය | කරුවූයේ |
| ඉදිරියෙ දසුන තුන්මංසල වී | දුටියේ |
| | |
| බැරල් පාලමකි තව ඉදිරියටම | යද්දී |
| ගඟ දෙපසින් ගස් වැල් සුලඟට | පැද්දී |
| වහින විටදි ඒ ගඟ පිරිලා ඉතිරෙද් | දී |
| සමහරු ඔරු පදිති ගඟ දෙපසට | යද්දී |
| | |
| ඉදිරියටම යද්දී මහ බෝ | ගසකි |
| රාජගිරිය නම සිව් මං සන්ධි | යකි |
| පෙර රජදවස කෝට්ටේ රාජධානි | යකි |
| යුධයෙන් දිනා ඇවිදින් කීවේ මාදිනුගම | වගකි |
| | |
| වත්ත පහල කුඹුකෙ ලිඳකි නාන්න | ට |
| ඊට ඉහල ලිද පැන් පවසින් නිවෙන්න | ට |
| කොස්, දෙල්, පොල් පිරිලා බලන්න | ට |
| මේ සිරි අතරිනුයි අප ජීවත් වුයේ | එකට |
| | |
| මා ආසයි නැවතත් යන්නට අතීතෙ | ට |
| ඒ මතකයන් එනවා මගේ මතකය | ට |
| කෙතරම් වෙනස් වුවද අද ගම ර | ට |
| සදා ආදරෙයි මා මාදින්නාගොඩ ගම | ට |

**කේ. ජී.එස්. පෙරේරා මිය**
**ගරු භාණ්ඩාගාරික**
**සී.ස. මාදින්නාගොඩ සණස සමිතිය රාජගිරිය.**

# විශ්වයේ ඇති සියළු සම්පත් ආරක්ෂා කරගනිමු.

ජීවත්වන සෑම ප්‍රාණියෙකුටම ජීවත්වීම සඳහා උපරිම අයිතියක් ඇ. යම්කිසිවෙකු එම අයිතීන් උදුරා ගැනීමට තැත් කළහොත් ස්වාභාව ධර්මය ඔහුට හෝ ඇයට නිසි දඬුවමක් ලබාදෙනු නිසැකයි. වර්තමාන සමාජයේ මේ සඳහා සාධනීය සාක්කි ඕනෑ තරම් ඇත. පසුගිය සතියකදී අප පරිසර දිනය සමරනු ලැබුවා. රජයක්, පුද්ගලික අංශයත් ඒ සඳහා පූර්ණදායකත්වයක් ලබාදුන්නා. සෑම හොඳ සහ නරක කාසියේ දෙපැත්ත මෙන් අප ලඟම තිබෙන දෙයකි. බුද්ධිමත්වූ මිනිසා මේ සියල්ල ආගමානුකූලව සදාචාරාත්මකව තෝරා බේරා ගත යුතුයි.

විශ්වය ගැන කතා කරනවිට පලමුවෙන්ම මතක්වන්නේ අප ජීවත්වන පරිසරය ගැනයි. එයට හානිකරන සහ හානිවන අවස්ථා දිනපතාම ඉහල යන බව පවසන්නේ කනගාටුවෙනි. අපේ වැඩිහිටියන්ගේ කාලයේදී දේශගුණික රටාවන් කොයිතරම් ක්‍රමාණුකූලව තිබුනාද? යල, මහ කාලයන් සඳහා අපේ ගොවි ජනතාව පූර්ණ සුදානමකින් කටයුතු කළා. ඔවුනගේ ඒ සුදානම හරියටම හරි ගියා. නියම කලට වැඩි වැටුනා. නියම කලට කරල් පැහුනා. එහෙත් ස්වාභාවධර්මය අපට එරෙහිවෙලා. අපේම ක්‍රියාකාරකම් නිසා. මේ නිසාම අපේ සම්පත් විනාශ වෙමින් යනවා. ''මතක තබාගන්න, මේ සම්පත් සදාකාලික නොවන වග..''

අපේ ජීවය රදා පැවැත්මට මහඟු කාර්යභාරයක් කරන ගහකොල, වනාන්තර විනාශ කරමින් තිබෙනවා. ප්‍රධාන පාරක් අයිනේ පැයක් ගත කර බලන්න. කොයිතරම් දැව කදන් ලොරි මගින් ප්‍රවාහණය කරනවාද



කියා ඔබටම දැකගන්න පුළුවන්. එම ලොරිවල ගෙනයන ගස් කදන් හඩමින් කියන්නේ අපව බේරාගන්න කියා නොව, ශ්‍රී ලංකාව කාන්තාරයක් වන්නට පෙර බේරාගන්න කියායි. අප අදහන සෑම ආගමකම, පරිසරය සමග සබදතාවක් ගැන කතා කර තිබෙනවා. එහෙම නම් අපේ ආගම හදවතින්ම අදහනවා වගේම, විශ්වයේ ඇති සියළු සම්පත්වල පැවැත්මට කිසිම ආකාරයකින් බාධා වන්නාවූ අයුරෙන් කටයුතු නොකරන්නට, හදවතට අත තබා පොරොන්දු වෙමු.

**ලක්ෂ්මන් ගුනවර්ධන පිටිපන නගරය - සණස වාර්තාකරු**

# මිත්‍ය මතට තබමු තිත

විසිඑක්වන සියවසේ ජීවත්වන ප්‍රාණීන් අතර මිනිසා ප්‍රමුඛස්ථානයට පත්වන්නේ උසස් මනසකින් යුක්ත වීමෙනි. එහෙත් ආදි ගල් යුගයේ පටන් පැවත එන සමහර සමාජ ධර්මතාවන් වර්තමානයේ ද මිනිසා විසින් පිළිගෙන පවත්වාගෙන යති. නොදියුණු යුගයේ මිනිසාගේ විශ්වාස, ඇවතුම්, පැවතුම් කෙරෙහි තදින් එල්බ ගත්තෝ මිත්‍යා දෘෂ්ඨිකයෝ නොවන්නේද?

ඉන්දීය බ්‍රාහ්මනයින්ගේ අවශ්‍යතාවයන් සඳහා පැවති මත, අදද ශ්‍රී ලාංකේය ජන සමාජයේ බහුතරයක් පිළිගෙන ක්‍රියා කරති. උදාහරණ ලෙස සතියේ ඉරුදින, අඟහරුවාද හා සිකුරාදා යන දිනයන් හී දිය නෑම අසුභයැයි බමුණන් එදා දැරූ මතය අපේ රට තුළත් සමහර ජන කොටස් අදහති. ඉන්දියාවේ ගංගා ජලයේ ස්නානයට හුරු වු බමුණන් හා එක්ව කුල හීනයන්ට නෑම තහනම් විය. එය අසුබයක් ලෙස දැක්වූයේ, බමුණන්ගේ ආත්මාර්ථකාමී අදහස් මුදුන්පත් කර ගැනීමටය.

එසේම ජ්‍යෙතිෂය මගින් දක්වන නැකත් ක්‍රම වේද, වර්තමානයේ නිෂ්ඵල බව දැක්වු අවස්ථා එමටය. ඊටද උදාහරණ ලෙස දැක්වීමට හූණු ශාස්ත්‍රය, හූණන් අඟවැටීම, හූණන් හඬ ගෑම, කපුටාගේ කරක් ගෑම, බල්ලාගේ කන් කැසීම මේ සියල්ල අද සමාජයට අසුබ යැයි භාරගෙන ක්‍රියාකිරීමට පෙළඹෙන්නෝ නොවෙති. කාර්ය සඵලත්වයට කාලය කලමනාකරණයෙන් සෑම මෙහොතකම මිනිසා උත්සාහ ගන්නේ ජීවිතයට අවශ්‍ය, පැවැත්මට නැතුවම බැරි මූල්‍ය සම්පත සොයා ගැනීමටය.

බරපතළ රෝගයකින් පෙලෙන්නෙකුට බෙහෙත් ලබාදීමට, හොඳ හෝරාවක් එනතුරු බලාසිටීම සේම විභාගයකට පෙනී සිටින දරුවෙකුට සුභ නිමිති පහළ වෙනතුරු බලා සිටීම ප්‍රතිඵල රහිත බව කිවමනාද? නිවසක් අළුතෙන් සාදා ගැනීමට පෙරුම් පුරන්නෙකුට, නව නිවහනකට ගෙවදීමට, දරු ප්‍රසුතියක් කිරීම සදහා සිසේරියන් සැත්කමක් කිරීමට, වැසිබර අහසක් දිස්වෙද්දී නව නිවහනට වහළය සෑදීමට, හොඳයි කියන හෝරාවක් ලබන තුරු බලා සිටීම ඥාණාන්විතද? මිථ්‍යා විශ්වාස ඔස්සේ කල්මරණ සමාජයකට, ශක්තියක් වී කුමණ ප්‍රයෝජනයක්ද?

මිනිස් ජීවියෙකු අභාවයට පත්වු විට, එම දේහයේ අවසන් කටයුතු සිදු කිරීම අඟහරුවාදා, සිකුරාදා දිනයන් යොදා නොගන්නේ අසුබ යැයි සිතිවිල්ල මතය.

මෙවැනි මිථ්‍යා මත පවතින සමාජයක, සංවර්ධන පිළිවෙත් ක්‍රියාත්මක කරන්නේ කෙසේද? ගතවන සෑම තත්පරයක්ම වටිනාකමින් පෝෂිතය. එසේ නම් ක්‍රියාකාරී මිනිසෙකු වීමෙන්, තම ශාරීරික සුවය පවත්වා ගනිමින් මූල්‍ය ශක්තිය පවත්වා ගැනීමට උත්සුක විය යුතු කාලය එළඹ ඇත. ආගම් ශාස්තෘවරුන් දේශනා කළ දහම් කරුණු සරළව සිතා බැලීමෙන් පිං, පව් නැත්නම් හොඳ, නරක යන වදන් වලට සීමාවී කාලය නැමැති මහඟු මිණෙහි ආලෝකය නැති කර ගැනීමට කිසිවෙකුත් උනන්දු නොවෙනු ඇති. ජන සමූහයාගේ ඇදහීමට පහසු වන සේ ආගමික සිද්ධස්ථාන හතු පිපෙන්නාසේ සෑම නගරයකම මෙන්ම ගම්බදවද ස්ථාපිත වීම දිනෙන් දින ව්‍යාප්ත වේ. මෙම සෑම බිම් අඟලකම කෘෂි වටිනාකම කිසිම රාජ්‍ය නිලධාරියෙකු පෙන්වා දීමට ඉදිරිපත් නොවීම ජාතියේ අභාග්‍යයකි.

සමුපකාර සමාජයක් බිහි කිරීමට දරණ සෑම උත්සාහයක්ම ඇල්මැරුණු ස්වභාවයක් ගෙන ඇත. සමුපකාරය ආරක්ෂා කරමින් පවත්වාගෙන යන අතලොස්සක් වු ස්වෙච්ඡා නායකයින්ට ද රාජ්‍ය තන්ත්‍රය නව නීති පනවමින් සමුපකාරිකයෙකු නිලයක රැදෙන කාලය සීමා කරන්නට ගෙන ඇති, අදුරදර්ශී මතය නීති රාමුවටම සීමා කර තබමු. එය කළහැක්කේ 'එකා සැමටත්, සැම එකාටත්' යන මතයේ පිහිටා සාමූහිකව ක්‍රියා කිරීමෙනි. සණස සාමාජිකත්වය අවදිවේවා

මිථ්‍යා මත ධාරීන් එදා සමාජයේ මෙන්ම වර්තමාන සමාජයේද සැරිසරති. ඔබ කළ යුත්තේ බුද්ධිමත්ව, සිහි නුවණින් තීරණ ගැනීමයි.

**හේමසිරි බෙනරගම**

# මාසික තිළිණය

ස.ණ.ස. කොළඹ පුවත් මාසික ප්‍රශ්ණයට කූපනය මගින් ඔබ සපයන, නිවැරදි පිළිතුරට තිළිණයක් පිරිනැමීමට කටයුතු සම්පාදනය කර ඇති බව සතුටින් දන්වමු.

ඔබ ජයග්‍රහකයෙක් නම්, ඔබේ සමිතියේ හා පෞද්ගලික අනන්‍යතාවය තහවුරු කරවා එම තිළිණය දිසා සංගමයෙන් ලබාගන්න.

**සංස්කාරක මණ්ඩලය**

# කියවන්න... දැනුම ලබන්න....

## දෝතට තෑගි ගන්න ....

ඔබ කළ යුත්තේ මෙහි පළවන ප්‍රශ්ණයට පිළිතුර කූපනයේ පුරවා තැපැල් පතක අලවා සණස පුවත් කොළඹින් අංක 220/1, හයිලෙවල් පාර, වත්තේගෙදර, මහරගම වෙත 2019 අගෝස්තු 15 ට පෙර එවීමයි. ජයග්‍රාහකයින් රැසක් සිටියහොත් කුසපත් ඇදීමෙන් වාසනාවන්තයා තෝරා ගනු ලැබේ.

**ප්‍රශ්ණය :-** **ණයදෙන සමිති ව්‍යාපාරය සුදු පාලකයින් විසින් ආරම්භකලේ 2019 ට පෙර වසර කීයකින්ද?**

**කූපන් තරගයේ ජයග්‍රහණය**

**කූපන අංක 05**

**සී.ර. එගොඩගම වේරගොල්ල සණස සමිතියේ**
**කේ.ජී. ශ්‍රියානි මිය**

## කූපන් අංකය 07

මුලකුරු සමග නම: ..........................................................

ස්ථිර ලිපිනය: ..........................................................

..........................................................

දුරකථන අංකය: ..........................................................

පුරුදු අත්සන: ..........................................................

සණස සමිතියේ නම: ..........................................................

..........................................................

පිළිතුර: ..........................................................

..........................................................

# වචනය

වචනය...... පරිසමාප්තාර්ථයෙන්ම අර්ථශූන්‍ය වේ .....
යමෙක් වචනය අර්ථකථනය කරයිද....?
නිර්වචනය කරයිද....?
අර්ථය සොයයිද....?
හරය සොයයිද....?
දේශනා කරයිද....?
තේරුම් ගන්නට උත්සාහ කරයිද....?
හෙතෙම... සසරටම ඇලෙයි... සසරෙම බැඳෙයි...

වචනයේ අර්ථ ශූන්‍ය බව
යමෙක්.... වටහා ගනියිද....
හෙතෙම.... ලෞකික ජීවිතය සතුටින් ගෙවයි....

වචනයේ අර්ථ ශූන්‍ය බව වටහාගත්....
යමෙක්... වචනය අත හරියිද...
හෙතෙම... සදාතනික වු ලොකෝත්තර සැපම ලබයි

**අජන්ත හේරත් - සභාපති කහටපිටිය සණස**

### පහත්ගම සණස
## මාසික කාන්තා වැඩසටහන



සී.ස. පහත්ගම හංවැල්ල සණස සමිතියේ කාන්තා කමිටුව විසින් මෙහෙයවන ලද මාසික කාන්තා වැඩ සටහන යටතේ ක්ෂණිකව අලුවා සාදා ගන්නා අයුරු පුහුණු කිරීමේ වැඩ සටහනක් පසුගියදා පහත්ගම සණස කාර්යාල පරිශ්‍රයේදී සිදු කරන ලදී.

මෙම අවස්ථාවට හංවැල්ල කලාප සම්බන්ධීකරන ලේකම් දිස්නා නයෝමි කලුබෝවිල මහත්මිය ද සහභාගි වූ අතර සම්පත් දායකත්වය ලබාදෙන ලද්දේ හංවැල්ල කලාපීය කාන්තා කමිටු අධ්‍යක්ෂිකා සී.ර. ඉහළ හංවැල්ල සණස සමිතියේ නීටා සිරිවර්ධන මහත්මිය විසිනි.

**කේ.ඒ. පියතිලක - ගරු සභාපති - පහත්ගම සණස**

## ඉගෙනීමේ අගය

කුඩා අවධියේ පටන්ම දැනුම　　වඩාගෙන
විභාග කඩඉම් පසුකර ජයක්　　ලබාගෙන
උසස් ලෙසට වැඩකරන්න දිරිය　　වඩාගෙන
අරමුණ වෙත පියනගනෙමි හොඳින්　　ඉගෙනගෙන

උගත් අයගේ උගත් වදන් සිතට　　ගන්නවා
යහපත් පුරවැසියෙකු වී සෙතක්　　සදනවා
ඉගෙනීමෙන් ලැබෙන අගය කියලා　　දෙනවා
ජය ටැඹ වෙත පියනැගුමට මඟ　　සලසනවා

දෙන ඔවදන් පිලිපැද ශිල්පය　　උගනින්න
අලුත් යමක් තම දිවියට මුසු　　කරගන්න
අන් අයටත් ඉගෙනීමේ අගය　　කියන්න
උගතුන් පිරිපුන් ලොවකට හෙටත්　　සදන්න

**මෙනුක මෙත්සිළු**
**වල්පොල සණස රන්තරු ළමා සමාජය**

### ජාතක කතා පොතෙන්
## ව්‍යග්ඝ ජාතකය

දෙව්රම් බිමෙහි කෝකාලිකයන්　　හමුවේ
දෙසුදම් අමාවකි, කවි බස ලෙස　　ලියවේ
හිමිකම් පෑව බරණැස රජු　　බඹදතුවේ
නරදම් බෝසතුන් රුක් දෙවියෙක්　　මතුවේ

කැලයේ පෙළින් පෙළ මහගස්　　විහිදිතියේ
කුලයේ ජවැති සිවුපාවුන් මෙහි　　සිටියේ
බලයේ රැඳුන කේසර සිංහය　　කුටියේ
රැලයේ ව්‍යග්ඝ තනිවයි නිතරම　　දිටියේ

උඟරන්, මුවන්, ගොදුරුය චණ්ඩ　　දෙදෙනාට
මිනිසුන් ගැවසුනේ නැත දඩයම්　　බහට
කැලයෙන් හමන දුඟදයි දරුණුම　　ගැහැට
පිලියන් යොදන්නට සිතූ, රුක්දෙව්　　ඊට

රැක් දෙව්වරුන් දෙදෙනෙකි, ගස්　　අරක්ගෙන
පලවා හරින්නට කතිකාවකි　　සහන
ගැහැටක් ඇතිවේය, නොදකිනු පන්නන　　හීන
කීමත් නෑසු කණ, පන්නා දැමුවා　　රෑන

කල්යල් බලා මිනිසුන් කැලයට　　එන්නේ
ගහකොල කපා බිම කොටමින්　　වපුරන්නේ
වන අඩවියේ රුක් දෙව් විසු ගස්　　ගොන්නේ
කඳ බිම හෙලන්නට සැරසෙයි,　　කොට මින්නේ

බෝසත් රුක් දෙවිඳු විමසා නැවත　　වරක්
ගෙන එන්නට රුදුරු සිව්පා සතුන්　　පෙලක්
පිළිකෙව් කලේ නොමයන්නට නැවත　　වරක්
මිනිසුන් රිසි පරිදි යෙදුනා පුරුදු　　වැඩක්

*උපදේශය: උපාය ශක්තියෙන් පැමිණි උවදුරු සංසිඳුවා ගත හැකිය.*

*-සිරි-*



**ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරිවරයෙකු**
**මෙන්ම**
**භාණ්ඩාගාරියේ මුදල් අධ්‍යක්ෂත්වරයකු වූ**

## සංගමයේ සභාපතිගෙන්

### ප්‍රශ්න විමසා පිලිතුරු ලබා ගන්න.

**ප්‍රශ්ණය** : සාමාජිකයකුට දිය යුතු ණය මුදලේ සීමාව නියම කළ යුත්තේ කවුද?

**පිළිතුර** : ණය සීමාවන් නියම කිරීම ගැන නියමයන් ඇත්තේ සමිතියේ අතුරු ව්‍යවස්ථාව තුලය. 2.6 වගන්තිය අනුව සීමාසහිත සමිතියක නම් කොටස් මෙන් 10 ගුණයක ණය මුදලක් හෝ දේපළ ඇපයට තබන අවස්ථාවක දී දේපලවල තක්සේරු වටිනාකමින් 50%ක් යන ප්‍රමාණය දන්වා හෝ සාමාජිකයකුගේ ණය සීමාව නියම කළ හැකිය. පුද්ගලික ණය සීමාව ලෙස සඳහන් කිරීමෙන්ම තේරුම් ගත යුතු කරුණ වන්නේ එක් එක් සාමාජිකයාට වෙන වෙනම ණය සීමාවන් තුල ණය ලබාදිය හැකි බවය. ඊට හේතුව වන්නේ එක් එක් අයගේ ණය අවශ්‍යතාවන් මෙන්ම ණය ගෙවීමේ හැකියාවන් ද වෙනස් වන බැවිනි. ඒ නිසා එක් එක් සාමාජිකයාගේ අවශ්‍යතාවන් සලකා, සමිතිය පනවාගෙන ඇති පැමිණීම, සාමාජික කාලය ආදිය ද සැලකිල්ලට ගෙන මහා සභාවට ඉදිරිපත් කර සීමාවන් නියම කළ හැකිය.

**ප්‍රශ්ණය** : දේපල ඇපයට තබා ණය දෙන විට ණය මුදලින් දහයෙන් කොටසක් කොටස් වශයෙන් ගත යුතුද?

**පිළිතුර** : අතුරු ව්‍යවස්ථාවේ 2.6 අනුව පැහැදිලිවන්නේ දේපල ඇප තබන විටක දී ඒ වෙනුවෙන් කොටස් ලබා ගැනීමේ නීතිමය අවශ්‍යතාවයන් නැත. එහෙත් ප්‍රාග්ධනයට හවුල්වීම සමුපකාර භාවිතයක් නිසා දරාගත හැකිවන පරිදි යම් මුදලක් කොටස් ලෙස තැබීම සුදුසුය. ගන්නා ණය මුදල සාමාන්‍යයෙන් විශාල වන බැවින් එයින් දහයෙන් එකක් ගැනීම යෝග්‍ය වන්නේ නැත.

**ප්‍රශ්ණය** : දේපල තක්සේරු කළ යුත්තේ කවුද?

**පිළිතුර** : එය තක්සේරු කිරීම සදහා ඉදිරිපත් කළ යුතු ආකෘතියක් සකස් කරගෙන (සණස සමිතිතුළ තිබිය යුතු අත්පොතෙහි ඇති පරිදි) කාර්යාලයේ අය හෝ කාරක සභිකයින් හෝ දෙදෙනෙකුට ස්ථානයට ගොස් තක්සේරු කිරීම ප්‍රමාණවත්ය. බලයලත් අය ලවා වාර්තා ගන්නේනම් ඔවුන්ට මුදල් ගෙවාගත යුතුය. සමුපකාරය සාමාන්‍යජනතාව පීඩාවට පත් කිරීම අවම කළ යුතුය. ඒ නිසා එවැනි වාර්තා ලබා ගැනීමට සාමාජිකයාට නියම කළ යුතු නැත. සාමාන්‍යයෙන් ප්‍රදේශ වටිනාකම විමසා බලා තීරණයකට එළඹිය හැකිය.

**ප්‍රශ්ණය** : සමිතියක සාමපිකයෙකුගේ යුතුකම් හා වගකීම් මොනවාද ?

**පිළිතුර** : මහා සභාරැස්වීම් වලට උපරිමයෙන්ම සහභාගි විය යුතුය. සමිතියේ මහා සභාව ගනු ලබන තීරණ මත කටයුතු කළ යුතුය. ගෙන ඇත තීරණයට තමා එකග නැති වුවද පොදු හා බහුතර තීරණය පිලිගැනීම අවශ්‍යවේ. සමිතියේ සාමාජිකයකු නම් තමන්ගේ මුදල් ගනුදෙනු කළ යුත්තේ එම සමිතිය සමග පමණි. ප්‍රමාණවත් ණය පහසුකම් නොලැබේ නම් අවශ්‍යතා අනුව වෙනත් ආයතන වලින් ණය ලබා ගැනීමට සිදුවේ. සියලු තැන්පත් කළ යුතු වන්නේ සමිතිය සමග පමණි. පොදු කටයුතු වලදී උපරිම දායකත්වය දිය යුතුය.

**ප්‍රශ්ණය** : සංගමයේ සාමාජිකයකුවන සමිතියක යුතුකම් හා වගකීම් මොනවා ද?

**පිළිතුර** : සමිතිය සාමාජිකයා නිසා කලින් පිලිතුරම මෙයට අදාළය. මහා සභා රැස්වීමට සහභාගිවීම, සංගමය ගන්නා තීරණ අනුව කටයුතු කිරීම. තීරණ ගැනීමේ අදහස් දැක්වීම. සමිතියේ අතිරික්ත මුදල් සංගමයේ තැන්පත් කිරීම, ණය අවශ්‍යතාවන් සංගමයෙන් ඉටුකර ගැනීම, ගිවිස ගත් ආකාරයට ගනුදෙනු සිදු කිරීම, සංගමය අවශ්‍යවන්නේ සමිතිවලට බැවින් එය ආරක්ෂා කර ගැනීම.

**ප්‍රශ්ණය** : සමිතියක කාරක සභිකයකුගේ හෝ සංගමයේ අධ්‍යක්ෂවරයෙකුගේ යුතුකම් වගකීම් මොනවා ද?

**පිළිතුර** : ඔහුත් සාමාජිකයකු නිසා සාමාජිකයාගේ යුතුකම් වගකීම් ඉටු කිරීම අවශ්‍යම වේ, අන් සාමාජිකයින්ට ආදර්ශයක්වන පරිදි කටයුතු කිරීම විශේෂිතවේ. ඔවුහු සිය සමිතිය හෝ සංගමය කෙරෙහි විශ්වාසයක් නැතිව බාහිර ආයතනවල තැන්පත් කරන්නේනම් නිලයක් නැති සාමාජිකයා සමිතිය කෙරෙහි විශ්වාසයක් තැබිය යුතු ද? සංගමය නම් එය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා තමා නියෝජනය වන සමිතියේ මුදල් සංගමයේ තැන්පත් නොකොට බාහිර ආයතනවල තැන්පත් කරන්නේ නම් සාමාජිකත්වය දරණ ආයතයට බැඳීමක් හෝ කැපවීමක් නැති අයෙකි. ඔහුගේ සමිතිය ද අන් සාමාජික සමිතිවල දෙනු ලබන්නේ කවර ආදර්ශයක් ද? කවරක් පැවසිය හැකිද? සාමාජිකයාට එහා ගිය විශ්වාසයක් නිලයක් දරන්නා වෙත නැත්නම් සමිතියක් හෝ සංගමයක් ශක්තිමත්වීම සදහා අන් සාමාජිකයාගේ කැපවීමක් අපේක්ෂා කළ නොහැක.


## රියදුරු ඇබෑර්තු

කොළඹ දිස්ත්‍රික් සණස සංගමය සදහා රියදුරු මහතෙකු අවශ්‍ය වී ඇත.

**අවශ්‍ය සුදුසුකම්**

වයස අවුරුදු 45ට අඩුවිය යුතුය.
බරවාහන රියදුරු බලපත්‍රයක් තිබීම.
වසර 05 කට නොඅඩු සේවා පළපුරුද්ද
මහරගම නගරය අවටින් විශේෂයි

**සාමාන්‍යාධිකාරී**
**සී.ස. කොළඹ දිස්ත්‍රික් සණස සංගමය**
**220/1, හයිලෙවල් පාර, වත්තෙගෙදර,**
**මහරගම.**

2019.07.10 දිනට පෙර ඉහත සුදුසුකම් සම්පූර්ණ අයගේ අයදුම්පත් ඉහත ලිපිනයට යොමු කරන්න.

# ස.ණ.ස.
පුවත් කොළඹින්

2019 ජූලි කලාපය



01 පිටුවෙන්....

## සී.ස. උද්‍යාන සණස සමිතිය

හිටපු සභාපති බර්ටි පෙරේරා මහතා ගෙන ආ ගමන් මග තවත් ශක්තිමත් කරමින් ඉදිරියට වැඩකර ගෙන යන වත්මන් සභාපති ඩබ්ලිව්.ඒ. කුමාරසිරි මහතාගේ ප්‍රධානත්වයෙන් සංවත්සර උළෙල පැවැත්විණ. ඒදින සංවත්සරයට සාමාජිකයින් 237 දෙනෙකු සහභාගී වී සිටි අතර සභාවේ කටයුතු අතරතුර ළමා සමිතියේ දු දරුවන් සහ සාමාජිකයින්ගේ විවිධ ඉදිරිපත් කිරීම් සමග උත්සවය අලංකාර විය. වසර 25 ක සේවය අවසන් කල භාණ්ඩාගාරික එම්.එම්. ලයනල් මහතාගේ ඉල්ලා අස්වීම කැපී පෙනෙන සිදු වීමකි.

වසර 25ක් අඛණ්ඩ සාමාජිකත්වය දැරූ 23 දෙනෙකුටත්, අනු කමිටු පැමිණීමටත් 12-12 පැමිණීමටත් අසුන්ගත් සියලු දෙනාටද ත්‍යාග පිරිනැමීය.

**නව නිලධාරි මන්ඩලය**

| | | |
|---|---|---|
| **ගරු සභාපති** | : | ඩබ්ලිව්.ඒ. කුමාරසිරි |
| **ගරු උපසභාපති** | : | ජේ.ඩබ්. ප්‍රසාද් උදයකුමාර |
| **ගරු භාණ්ඩාගාරික** | : | බර්නාඩ් සෙනරත් |
| **ගරු ලේකම්** | : | ඒ.කේ. ධනපාල |
| **ගරු කාරකසභික** | : | ජමුනා ක්‍රිශාන්ති, කල්‍යානි ලියනගේ, සනත් අතපත්තු, ටයිනි ලක්චානි මෙනෙවිය, සංජීවනී විජේතුංග |



**ප්‍රසාද් විජේවර්ධන**
**ඡායාරූප හා සටහන - උද්‍යාන වාර්තාකරු**

02 පිටුවෙන්....

## සණස ව්‍යාපාරයේ අනන්‍යතාවය පිළිබඳව

6 ස්වෙච්ඡා නායකත්වය සහ කාර්ය මණ්ඩලය

මෙම සාධකය ව්‍යාපාරයේ අනන්‍යතාවය ගොඩ නැංවී මෙහිලා විශාල දායකත්වයක් සිදුකර ඇත. මේ තුලින් රටේ මානව ප්‍රාග්ධනය සංවර්ධනයෙහිලා සිදුකර ඇති කාර්ය භාරය අතිමහත්ය. මෙය ද ජාතික වශයෙන් ඇගයීමට ලක්වීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ද තවමත් සකස් වී නොමැත.

දැන් ඔබට යමක් වැටහෙනු ඇතැයි සිතමි. මා ඉහතින් දක්වා ඇති මූලික සාධක ඉතා දිගු කාලයක් තුල ක්‍රමයෙන් ගොඩ නැංවෙමින් සමස්ත ව්‍යාපාරයට ලබා දී ඇති අනන්‍යතාවය මිල කළ නොහැකිය. මෙම අමිල අනන්‍යතාවයක් පවතින ව්‍යාපාරයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය ඉහල නැංවීම සඳහා එක් ජාතික වැඩපිළිවෙලක අවශ්‍යතාවය ඉතා තදින් දැනෙන යුගයකි.

මෙය සිදුකිරීමට නම් අපගේ කාර්ය භාරය කුමක්ද ? “ Be chage” ‘වෙනස්වීමයි’ මෙය කෙසේ සිදු කල යුතු ද යන්න විමසා බැලීමට නම් අප සතුව තිබෙන ඉහත ශක්තීන් පිළිබඳව වඩා හොඳින් තේරුම් ගත යුතුය. ඒවා සියල්ල කැටි කොටගත් විට අපගේ විශාලම ශක්තිමය ව්‍යාපාරයේ ‘අනන්‍යතාවය’ බව ඔබට වැටහෙනු ඇත. එසේනම් දැන් අපට අවශ්‍ය සියළු සම්පත් තිබේ. එසේ නම් අවශ්‍ය කුමක් ද? පිළිතුර වන්නේ ක්‍රමවත් සැලසුම්ගත ජාතික වැඩපිලිවෙලක් සහ එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මෙහෙයුම් ක්‍රියාවලියයි.

01 පිටුවෙන්....

## විශේෂ ධර්ම දේශනාව.....

රටේ පැවති අයහපත් තත්වය නොතකා සමිතියේ අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර බුදුරජාණන් වහන්සේගේ තෙමගුල සිහිපත් කරමින් කාලීන ධර්ම දේශනාවක් සාමාජිකයින් 200කට වැඩි පිරිසක් සහ ප්‍රදේශවාසීන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

ධර්ම දේශනාව ශ්‍රවණය කිරීමට පැමිණි සියළුම දෙනා හට කාන්තා කමිටුව විසින් උදේ ආහාරය සමග බෙලිමල් පානයක් ලබාදෙන ලදී. ධර්ම දේශනාවෙන් පසුව සියළුදෙනා හට දිවා ආහාරය දෙන ලදී.

**වාර්තාව - සුනිල් අබේසුන්දර සභාපති**
**රාජගිරිය නැගෙනහිර සණස**

## සර්වරාත්‍රික පිරිත් දේශණය හා සංඝගත දක්ෂිණාව

සී.ස. දකුණු ගොඩිගමුව සණස සමිතියට වසර අසුවක් සපිරීම නිමිත්තෙන් පැවැත්වූ සර්ව රාත්‍රික පිරිත් දේශණය හා සංඝගත දක්ෂිණාව

වර්ෂ 1938 ක් වූ ජුනි මස 05 වන දින වෛද්‍යාචාර්ය වය්.ඒ.ඩී. ඒබ්‍රහම් මහතාගේ මුලිකත්වයෙන් සාමාජිකයන් 26 දෙනෙකුගෙන් අප සමිතිය ආරම්භ කර 1939.04.19 වන දින සී. 379 යටතේ දකුණු ගොඩිගමුව සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබද සමුපකාර සමිතිය ලෙස ලියාපදිංචි කර ඇත.

වසර අසුවක අභිමානය සමරනු වස් සමිතියේ ආරම්භයේ සිට මේ දක්වා මිය පරලොව ගිය සමිතියේ ආරම්භක ගරු සභාපති වෛද්‍යාචාර්ය වයි.ඒ.ඩී. ඒබ්‍රහම් මහතා, ගරු භාණ්ඩාගාරික වයි.ඒ.ඩී. සැමුවෙල් මහතා, ගරු ලේකම් ඩී.ජේ. සමරකෝන් මහතා ඇතුළු සියළුම නිළධාරින්, සාමාජික සාමාජිකාවන්ට හා රට ජාතිය වෙනුවෙන් දිවි පිදු රණවිරුවන්ට පිං පමුණුවමින්







වර්තමාන ගරු සභාපති ඩී.ආර්. වැලිවත්ත මහතා ඇතුළු නිළධාරි මණ්ඩලයට, කාර්ය මණ්ඩලයට, සියළුම අනු කමිටු හා සාමාජික සාමාජිකාවන්ට, ගණුදෙනු කරුවන්ට, ප්‍රදේශවාසීන්ට හා රටට ජාතියට සෙත් ප්‍රාර්ථනා කරමින්,

ජුනි මස 01 වන දින අති විචිත්‍රවත් පෙරහැරකින් ගරු සංඝරත්නය සර්ව රාත්‍රික පිරිත් දේශණය සදහා සමිති පරිශ්‍රයට වැඩමවූ අතර ජුනි මස 02 වන දින විසිපස් නමක් උදෙසා සංඝගත දක්ෂිණාවක් ද පිරිනමන ලදී.

## ශ්‍රී ලංකාවේ සුන්දර ස්ථාන නරඹමු.

### මෙවර - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

මේ දිස්ත්‍රික්කයේදී ත්‍රිකුණාමලය ස්වාභාවික වරාය, සේරුවිල පුදබිම (බුදුන් වහන්සේගේ තෙවන ලංකා ගමනේදි මෙම පුද බිමට වැඩම කර ඇති බව ඉතිහාසයේ සදහන්වේ.)

තිරියායේ ගිරිහඩු සෑය, වෙල්ගම් වෙහෙර, කෝකිලායි කුරුලු අභය භූමිය, චීන වරාය හා කොඩ් වරාය, ගෝකණ්ණ මහා විහාරය, කින්නියා උනු දිය ළිං, කොට්ටියාරාමය, ප්‍රේඩ්රික් කොටුව, තරුකෝණේෂ්වරම් කෝවිල, රාවණා බෑවුම ආදිය ඔබට මෙම දිස්ත්‍රික්කයේදී දැක බලාගත හැකිය.

**පොතපත ඇසුරින්**
**එම් රොහාන් ජේ. පෙරේරා - ප්‍රකාශන කමිටු නියෝජිත**

## සාතිශය සංවේගය



සී.ස. කරගම්පිටිය සණස සමිතිය නියෝජනය කරමින්
කොළඹ දිස්ත්‍රික් සණස සංගමයේ
මධ්‍යම කාන්තා උප සභාපතිනිය
වශයෙන් සණස ව්‍යාපාරයට
මහඟු මෙහෙවරක් ඉටුකල

**නෝරාද සිල්වා මහත්මිය**

*දෙව්මව් තුරුලේ*
*සාමදානයේ සැතපේවා ප්‍රාර්ථනා කරමු.*

**කොළඹ දිස්ත්‍රික් ස.ණ.ස. සංගමයේ**
**ගරු සභාපතිතුමා ප්‍රමුඛ කාර්යසාධන මණ්ඩලය**

## සුභ උපන්දිනයක් වේවා !!

**කරගම්පිටිය සමිතියේ පසුගිය මස උපන් දිනය සැමරූ අය**


**එස්. සිල්වා**


**එච්.කේ. චන්ද්‍රකාන්ති**


**එස්. පෙරේරා**


**ඩබ්.කේ. සෝමවති**


**ඒ.ආර්. චන්ද්‍රවතී**


**කේ.ඒ. පාලිතරත්න**


**කේ. රෝහිණි**


**ආර්. පීරිස්**


**අයි. සිල්වා**


**ගීතිකා ප්‍රභානි**


**ජේ.ද. කොස්තා**


**එස්.පී. අපෝන්සු**


**එම්. ශානිකා**

# සී.ර. බටුවන්දර නව නිවහනකට පිවිසෙයි

කොළඹ දිසා සංගමයේ සාමාජික අංක 125 සාමාජිකත්වයේ සිටි ලියාපදිංචි අංක ඊ. 2724 දරන සීමාරහිත බටුවන්දර සමිතිය සිය නව නිවහනට පසුගියදා ගෙවිදින ලදී.

## ගරු කාරක සභිකයින්

| | | |
|---|---|---|
| ගරු සභාපතිණි | : | පී.ඩී. රම්‍යා ප්‍රියන්ති |
| ගරු උපසභාපතිණි | : | රත්නපාලි හරිස්චන්ද්‍ර |
| ගරු ලේකම් | : | ජේ.ඒ. දයාරත්න |
| ගරු භාණ්ඩාගාරික | : | රංජනී වික්‍රමසිංහ |
| ගරු කාරකසභික | : | පී.ඩී. දිරන්ෂා මනෝහාරි, කාන්ති උඩුවන, දයා රාජිත |





















සටහන -
සුමිත්‍රා ජයලත්
කළමණාකාරිනී